නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 04

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# ඉකි බිඳින මල් කැකුළ

ලොවේ තදකම් දරා ගෙන නුඹ සිටියේ සෙවණැල්ලක් වෙලා
ගැරහුවත් හැම බැන්නේ නෑ නුඹ තව ම මතක යි ගුණ නුරා
යන්න ගිය මුත් නුඹේ සෙනෙහස තවම විඳිනවා දිවි පුරා
එදා පැල නො ව අද තියෙන්නේ අම්මේ පොඩි දූ තනි වෙලා

අම්මේ එළවළු දෙකක් හදලා දුන්නා දානේ පින් තකා
ගෙනා බටු ටිකවත් තැලුවේ නෑ සාදු වළඳන් නෑ කියා
නුඹේ සෙනෙහස පිරුණු පැල අද අඳුර ඇවිදින් රජ වෙලා
අම්මා කියනුයේ කොහොම ඇය හට ඔබේ පොඩි දූ ගොළු වෙලා

අම්මේ නුඹ නැති දවසේ ඉඳලා ගියේ නෑ පාසල් මෙමා
තිබූ ගවුමත් ඉරා දැමුවා අත් පිස්නේ දැලි වැඩි නිසා
ටීචර් තවමත් හොයනවලු මං සිලිදි කිව්වා හමු වෙලා
යන්නේ කොහොම ද අම්මේ මං එහි කුස්සියේ වැඩ බේරිලා

හැමදා ම ගෙයි කිවි බිව්ය මිස නෑනේ නින්දක් රැය පුරා
අප්පච්චිවත් එන්නේ නැනේ කුස්සියේ මං තනි වෙලා
කැඩුණු උළු කැට කැලි අතුරින් ගණිනවා තරු නෙත් අයා
අම්මේ තරුවක් වී හිඳින්නකෝ මගේ අහසේ පායලා

හැඬුව මුත් වැට කඩුලු ළඟ මා බැලුවේ නෑ ඔහුවත් එදා
මුදලි පුතු හා ගියේ හිතකින් නොවේ පොඩි දූ අඬ අඬා
දණ නමන්නට ඔබේ සොහොන ළඟ අම්මේ බෑ බඩ ලොකු වෙලා
මලක් දා හිටගෙන ම වැන්දා නම මසින් යළි එනු සිතා

යූ.බී.එම්. සංදීපනි
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
madunikasandeepani39@gmail.com

9 772950 655005